
# සමනල් බඹයි...!
# ටොළුවෝ පිකයි...!



**සෙතුලි අටුගොඩ**

**මහ/මහාමායා බාලිකා විද්‍යාලය**

**2 ශ්‍රේණිය - D**

# සමනල් බබයි
# යාළුවෝ ටිකයි

සෙතුලි අටුගොඩ

# සමනල් බබයි යාළුවෝ ටිකයි

සෙතුලි අටුගොඩ

2 ශ්‍රේණිය **D**

මහමායා බාලිකා විදුහල, මහනුවර

කර්තෘ ප්‍රකාශනයකි

ප්‍රකාශන දිනය : 2025/02/08

ISBN : 978-624-208-587-6

# පිදුම

මාගේ මේ පුංචි උත්සහය
මගේ ආදරණීය
අම්මාටත්
අප්පච්චීටත්
පන්තිභාර ගයාත්‍රි ගුරු මැණියන්ටත්
ආදරයෙන් පිළිගන්වමි !!!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණියුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන “හෙරණගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක කාලෙක පුංචි කැලෑවක
සමනල් පවුලක් ජීවත් වුණා.

ඒ පවුලේ සමනල අම්මයි, සමනල
තාත්තයි, පුංචි සමනළ පැටියෙකුයි හිටියා.

ඒ කැලෑවෙ හිටපු දළඹු පැටියයි, මී මැසි
පැංචයි, කුඹි බබයි මේ සමනල්
පැටියාගේ යාලුවෝ.



මේ යාලුවෝ එකතු වෙලා හැමදාම හැංගි මුත්තං සෙල්ලම් කරනවා.



වැස්ස කාලේ, එක දවසක සමනල්
පැටියයි, මී මැසි පැංචයි උදෙන්ම
සෙල්ලම් කරන්න ආවා. ඒත් අනිත්
යාලුවෝ නෑ.

ඊට පස්සේ මේ දෙන්නා දළඹු පැටියවයි,
කූඹි බබාවයි සොයාගෙන කැලෑව
ඇතුලටම පියාඹගෙන ගියා.

අනේ මෙන්න එයාලා ඉන්නවා කැලෑව
ඇතුළටම වෙලා හරිම දුකෙන්.

"ඇයි කූඹි බබා දුකෙන් ඉන්නේ...?" මී
මැසි පැංචා ඇහුවා.

"අපි ගොඩක් වෙලා බලන් හිටියා ඔයාලා
සෙල්ලම් කරන්න එනකන්" සමනල්
පැටියා කිව්වා.





අපේ අම්මට කෑමට මොකුත් හොයාගන්න විදිහක් නෑ" දළඹු පැටියා කිව්වා.

"ඔව්, අපේ ගුලටත් වතුර පිරිලා, තිබුණු කෑම ඔක්කොම වතුරට යට වෙලා" කූඹි බබා දුකෙන් කිව්වා.

සමනල් පැටියාටයි, මී මැසි පැංචටයි හොඳටම දුක හිතුනා.

"පොඩ්ඩක් ඉන්න අපි ඉක්මනටම ඔයාලට කෑම ටිකක් ගේන්නම්" මී මැසි පැංචා කිව්වා.

ඒ දෙන්නා ඉක්මනට පියාඹලා මී මැසි පැංචගේ ගෙදරට ගියා.

"අම්මේ.. අම්මේ.. මී පැණි තියෙනවද?" මී මැසි පැංචා අම්මාගෙන් ඇහුවා.

"මොකද පුතේ  මේ කලබලයෙන්, කරදරයක්වත්ද?"  මී මැසි අම්මා ඇහුවා.

"අනේ අම්මේ... අපේ යාලුවෝ බඩගින්නෙ. එයාලට කන්න මුකුත් නැහැලු මේ වැස්ස නිසා" මී මැසි පැංචා උත්තර දුන්නා.


"අනේ පැංචෝ එයාලව එක් කරගෙන එන්න. අපි එයාලට මී පැණි දෙමු" මී මැසි අම්මා කිව්වා.

මී මැසි පැංචට හරිම සතුටුයි.

එයා සමනල් පැටියත් එක්ක ඉක්මනින් පියඹලා ගිහින් යහළුවන්ව එක් කරගෙන ආවා.

දළඹු පැටියයි කූඹි බබායි හරිම සතුටින් මේ
පැණි වල රස බැලුවා.
හැමෝටම හරිම සතුටුයි.

යාලුවෝ හැමෝම හොඳින් බඩ පුරවාගෙන
සෙල්ලම් කළා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්